ගුවන් සේවිකාවන් ලෙසින් රැකියා ලබාදෙන බව පවසමින්, තරුණියන්ට ලිංගික හිංසාවන් සිදුකළ පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් මව්බිම පුවත්පතේ ලිපියක් පළ වී තිබිණි. එම සැකකරුට එරෙහිව, ලිංගික අතවර කිරීම, නිරුවත් ඡායාරූප සන්තකයේ තබාගැනීම සහ සාපරාධී බියගැන්වීම යන චෝදනා එල්ල වී තිබිණි.

මව්බිම ලිපියක් (දෙසැ. 25, 2022) ඔස්සේ එම සිදුවීම දැක්වී තිබුණේ මේ අයුරිනි.

* "ගුවනේ පා කරන බවට රූමත් තරුණියන් අන්දා, Nude ගේමක් ගහපු සල්ලාල මනු කියවන්නා" යනුවෙන් සිරස්තලය යෙදී තිබිණි.
* කාන්තාවන්ගෙන් ඔහු ලබාගත්තේ යැයි සිතිය හැකි පාද නිරාවරණය වී ඇති ඡායාරූප කිහිපයක් සහ ගුවන් සේවිකාවකගේ පසුපස ඡායාරූපයක් ද ලිපිය තුළ පළ වී තිබිණි.
* "රූමත්" වැනි යෙදුම් ඔස්සේ මෙම සිදුවීමට අදාළ තරුණියන්ව හඳුන්වා දී තිබිණි.
* හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) ආකාරයේ උපසිරස්තල කිහිපයක්, ලිපිය තුළ සඳහන් කර තිබිණි.

ඔබේ අදහසට අනුව,

1) මෙම සිරස්තලය ඔස්සේ, ලිංගික අතවර කිරීම, නිරුවත් ඡායාරූප සන්තකයේ තබාගැනීම සහ සාපරාධී බියගැන්වීම යන චෝදනාවන්ගේ සැබෑ බරපතළ බව පාඨකයාට සන්නිවේදනය වන්නේ ද?

2) "රූමත්" වැනි යෙදුම්, හැඟීම් කළඹවන සුළු උපසිරස්තල සහ, කාන්තා පාද නිරාවරණය වන ඡායාරූප ලිපියට එක් කොට ඇත්තේ, මෙම ලිපියට අනවශ්‍ය හැඟීම් කළඹවන සුළු බවක් ලබාදීමට ද?

3) මේ සියල්ලම සමඟින් බැලූ විට, කාන්තාව ලිංගික වස්තුවක් ලෙසින් හැඟවුම්කරණය වීමක් ද සිදු නොවන්නේ ද?

4) ඒ අනුව, මෙම සිදුවීමෙන් පාඨකයා ග්‍රහණය කරගත යුතු සියුම් කරුණු, මෙම සිදුවීම පසුපස ඇති සමාජ ගැටළු පාඨකයාගේ අවධානයෙන් ගිලිහී යෑමේ අවදානමක් නොමැතිද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න.